ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

***

පුවත්පත් නිවේදනය

## පස් වන ජාත්‍යන්තර යෝගා දිනය ජූනි 15 වන දින කොළඹදී සමරනු ලබයි

ඉන්දියාවේ මූලිකත්වයෙන් යෝජනා කළ පරිදි 2014 වර්ෂයේදී එක්සත් ජාතීන්ගේ මහ මණ්ඩලය සෑම වසරකම ජූනි 21 වන දින ජාත්‍යන්තර යෝගා දිනය ලෙස නම් කරන ලදී. මෙම යෝජනාව සඳහා රටවල් 170 කට අධික ප්‍රමාණයක් සහයෝගය දැක්වූ අතර ශ්‍රී ලංකාව, ඉන්දියාව සමග ඒ සඳහා මූලිකත්වය ගත් රටවල් අතරින් එකකි. ආයුර්වේදය මෙන්ම යෝගා ව්‍යායාමද ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර පොදු උරුමයේ කොටසකි. 2015 වර්ෂයේ සිට ජාත්‍යන්තර යෝගා දිනය දහස් ගණනක් වූ යෝගා පිළිබඳ උනන්දුවක් දක්වන පිරිසගේ සහභාගීත්වයෙන් දිවයින පුරා සැමරේ.

මෙම වසරේදී පස් වන ජාත්‍යන්තර යෝගා දිනය සැමරීම සඳහා විශේෂ වැඩසටහනක් සංවිධානය කර තිබෙන අතර එය ජූනි 15 වන සෙනසුරාදා පෙ. ව 6 ට කොළඹ නිදහස් චතුරස්රයේදී පැවැත්වේ.

ශ්‍රී ලංකාවේ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, ටාටා මෝටර්ස් සමාගම සහ ශ්‍රී ලංකාවේ කීර්තිමත් යෝගා ව්‍යායාම ආයතන වන ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානය, රාම් ක්‍රිෂ්ණා ආයතනය, අෂ්ටංක යෝගා මන්දිර්, සෙත්සද යෝගා, හත යෝගා මධ්‍යස්ථානය, ක්‍රියා බබාජි යෝගා අරණ්‍යම, ධම්‍යා යෝගා, Institute of Human Excellence, My Yoga Lounge, ශක්ති ආනන්ද් යෝගා මධ්‍යස්ථානය (මඩකලපුව), Adhi Yogam, Arogya Anahata Yoga, Samskruti Patanjali Yoga Centre සහ Rhythmic Yoga මෙම වැඩසටහන සඳහා අත්වැල් බැඳ ගෙන ඇත.

යෝගා, ප්‍රාණයාම සහ භාවනා ඇතුළත් මෙම වැඩසටහන සඳහා සැමටම ආරාධනා කරනු ලැබේ. මේ සඳහා නොමිලේ සහභාගී විය හැකිය. (යෝගා මැට් රැගෙන ඒමට කාරුණික වන්න) ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය විසින්

සහභාගීත්ව සහතිකයක්ද පිරිනමනු ලබයි. කරුණාකර iccrcolombo2gmail.com යන විද්‍යුත් තැපැල් ලිපිනයට විද්‍යුත් තැපෑලක් යොමු කර වැඩසටහන සඳහා ලියාපදිංචි වන්න.

වැඩි විස්තර සඳහා දුරකථන අංක 2684698 ඔස්සේ ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානය අමතන්න.

කොළඹ
2019 ජූනි 11